මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: CGO/ASM/Policy/Cir/ (VOL III)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.04.30

**වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2024**

සියලුම: අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති සහ විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
රාජ්‍ය බැංකු හා රාජ්‍ය සමාගම් සභාපතිවරුන්

**රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය**

**රජයේ දේපළ අස්ථානගතවීම සහ අවභාවිතය වැළැක්වීමට නිසි පරිදි ලේඛන ගත කර පවත්වා ගැනීම සහ වාර්තා කිරීම**

**රජයේ ව්‍යාපෘතිවල මූල්‍ය නොවන වත්කම්**

රජයේ දේපළ අස්ථානගතවීම සහ අවභාවිතය වැළැක්වීමට මෙන්ම රජයේ දේපල උපරිම ඵලදායීතාවයෙන් ප්‍රයෝජනයට ගැනීම තහවුරු කිරීම සඳහා, සියලු රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2022 මගින් ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

02. තවද, රජයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කළ මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් වන අවස්ථාවලදී, අදාළ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම හෝ නතර කිරීම සිදු කළ වහාම අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත පරිදි කටයුතු කළ යුතු වේ:

i. මෝටර් වාහන: නැවත අනුයුක්ත කිරීම හෝ අපහරණය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා, එම වාහනවල ලියාපදිංචි අංක හා වත්මන් ධාවන තත්වය කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ii. මෝටර් වාහන හැර අනෙකුත් මූල්‍ය නොවන වත්කම්: නැවත උපයෝජනය කිරීම හෝ අපහරණය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා, එම වත්කම් ඵලදායීව නැවත උපයෝජනය කිරීම හෝ අපහරණය කිරීම සඳහා යෝජනා සහිතව එම වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

03. තවද, 2021 ජනවාරි 01 දින හෝ ඉන්පසු දැනටමත් සම්පූර්ණ කර හෝ නතර කර ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් වන අවස්ථාවලදී, එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කළ සියලුම මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු 2024 ජූනි 30 දිනට පෙර අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

04. මේ සම්බන්ධයෙන් වන ඔබගේ සහයෝගය ඉතා අගය කර සලකමි.

**අත්.කළේ/ කේ.එම්.මහින්ද සිරිවර්ධන**

**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති